# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1985 අංක 40 දරන මිනිස්බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනත

---

[සහතිකය සටහන් කළේ 1985 ඔක්තෝබර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 ඔක්තෝබර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල: රු. 1.80 යි    තැපැල් ගාස්තුව: ශත 90 යි

# 1985 අංක 40 දරන මිනිස්බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනත

[සහතිකය සටහන් කළේ 1985 ඔක්තෝබර් මස 22 වන දින.]

එල්. ඩී.—ඕ. 39/85

**මිනිස් බලය උපයෝගි කර ගැනීම පිණිස නිසි බලධරයකු පත් කිරීම සඳහා ද, ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට අනිවාර්ය යෙන් සහ ස්වෙච්ඡාවෙන් බඳවා ගැනීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය නියම කිරීම සඳහා ද මිනිස්බල සංචිත කාර්ය භාර මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතය, ජාතික ශිෂ්‍යභට බලකාය, ජාතික සහායක හමුදාව සහ අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් පරිපූරක හමුදාවන් ද බඳවා ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1985 අංක 40 දරන මිනිස්බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

## නිසි බලධරයකු පත් කිරීම

**නිසි බලධරයකු පත් කිරීම.**

2. ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයා විමසා නමින් හෝ නිල යෙන් සුදුසු හා නිසි තැනැත්තකු (මෙහි මින් මතු "බලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මිනිස් බලය උපයෝගි කර ගැනීම සඳහා නිසි බලධරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

**බලධරයා වෙත බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම.**

3. (1) මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් යටතේ තමා වෙත පවරා දෙනු ලබන යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය බලධරයා විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ තමා වෙත පවරා දෙන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කොට දෙන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් බලධරයා විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, වෙනත් යම් රජයේ නිලධරයකුට පවරා දෙනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ මේ කොටසෙහි "අමාත්‍යවරයා" යන්නෙන් මිනිස්බලය උපයෝගි කර ගැනීමේ හා පුහුණු කිරීමේ විෂයය සහ කර්තව්‍යය භාර අමාත්‍යවරයා අදහස් වේ.

## II වන කොටස

## ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයෙහි ජාතික සේවය සහ ස්වෙච්ඡා සේවය

**ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට බඳවා ගැනීම.**

4. (1) "ජාතික සේවා නියමය" යනුවෙන් හඳුන්වනු ලබන්නා වූද, අමාත්‍යවරයා විසින් කරනු ලබන්නා වූ ද නියමයෙහි නිශ්චිතව දැක්වෙන යම් තැනැත්තන් ගණයකට අයත් වන අදාළ සියලු තැනැත්තන්, මේ පනතේ ඇති විධිවිධානවලට අනුකූලව, රටේ ආරක්ෂක අවශ්‍යතා උදෙසා ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට බැඳෙන ලෙස බලධරයා විසින් විධාන කරනු ලැබූ විට, එසේ ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට බැඳිය යුතු ය.

2—ඒ 086186—7,850 (85/10)

(2) බඳවා ගැනීම සඳහා වූ තෝරා ගැනීමේ පරීක්ෂණයකට පැමිණෙන ලෙස ජාතික සේවා නියමය අදාළ වන කවර වූ හෝ තැනැත්තකුට බලධරයා විසින් කලින් කල නිවේදනයක් මගින් නියම කරනු ලැබිය හැකි ය. එසේ නිවේදනයක් මගින් නියම කරනු ලැබූ සෑම තැනැත්තකුම, ඒ නිවේදනය අනුව කටයුතු කළ යුතු ය. බඳවා ගැනීම සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා පැමිණෙන ලෙස නියම කරනු ලැබූ සෑම තැනැත්තකුම, ඒ නිවේදනයෙහි දක්වෙන දිනයේ දී සහ වේලාවේ දී එහි දක්වෙන කාර්යාලයට පැමිණිය යුතු අතර, බඳවා ගැනීම සඳහා වූ තෝරා ගැනීමේ පරීක්ෂණ අවසාන වනතුරු දිනපතා හෝ නිලධරයා විසින් ඔහුට නියම කරනු ලබන පරිදි වෙනත් යම් වේලාවක හෝ පැමිණ සිටිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ දැනුම් දෙනු ලැබ, තෝරා ගැනීමේ පරීක්ෂණය සමත් වන කවර වූ හෝ තැනැත්තකුට ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට බැඳෙන ලෙස බලධරයා විසින් විධාන කරනු ලැබූ විට, නියමිත කාර්ය පටිපාටිය අනුව, ඔහු එම සේවයට බැඳිය යුතු ය.

(4) රටේ ආරක්ෂක අවශ්‍යතා සැලකිල්ලට ගෙන, බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තකු ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතය සඳහා බඳවා ගනු ලැබීමෙන්, බලධරයා විසින් නිදහස් කරනු ලැබිය හැකි ය. එවැනි නිදහස් කිරීමක දින සිට අවුරුදු දෙකක කාලසීමාවක් ඇතුළත ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට බැඳෙන ලෙස බලධරයා විසින් එසේ නිදහස් කරනු ලැබූ කවර වූ හෝ තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, මේ උපවගන්තියේ විධිවිධාන යටතේ බඳවා ගනු ලැබීමෙන් නිදහස් කරනු ලැබුවා වූ ද, ඒ යටතේ විධානයකට යටත් නොවන්නා වූ ද කවර වූ හෝ තැනැත්තකු, තදනන්තර ජාතික සේවා නියමයක දක්වෙන ගණයකට ඇතුළත් වේ නම්, ඒ තැනැත්තා ජාතික සේවය සඳහා යටත් වන්නේ ය.

(5) ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්, බලධරයා විසින් ජාතික සේවාවෙන් නිදහස් කරනු ලැබිය හැකි හේතු, ජාතික සේවා නියමයෙහි දැක්විය යුතු ය.

(6) (2) වන උපවගන්තිය යටතේ වූ නිවේදනයක් අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ සෑම තැනැත්තකු විසින් ම, ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට එම තැනැත්තා බඳවා ගැනීම පහසු කිරීම පිණිස බලධරයා විසින් නියම කරනු ලබන්නා වූ සියලු තොරතුරු ඒ බලධරයා වෙත සපයනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "අදාළ තැනැත්තා" යන්නෙන් වයස අවුරුදු දහ අටට අඩු නොවන්නා වූ ශ්‍රී ලංකාවේ කවර වූ හෝ පුරවැසියකු අදහස් වේ.

5. බලධරයා විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින්, ජාතික සේවා නියම යන් අදාළ නොවන්නා වූ වයස අවුරුදු දහ අටට නො අඩු තැනැත්තන්ට ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයෙහි ස්වේච්ඡා සේවයේ යෙදෙන ලෙස ඇරයුම් කරනු ලැබිය හැකි ය. මේ වගන්තියේ විධිවිධාන අදාළ වන තැනැත්තන්ගේ ගණය තෝරා ගැනීමේ ආකාරය නියම කරනු ලැබිය යුතු ය. ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට ස්වේච්ඡාවෙන් බැඳීම.

6. (1) (අ) 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ දැනුම් දෙනු ලැබූ විට, තෝරා ගැනීමේ පරීක්ෂණයක් සඳහා වාර්තා කිරීම පැහැර හරින ; හෝ වැරදි.

(ආ) 4 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට බැඳෙන ලෙස විධාන කරනු ලැබූ විට එසේ බැඳීම පැහැර හරින ; හෝ

(ඇ) 4 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ සපයන ලෙස නියම කර ඇති තොරතුරු සැපයීම පැහැර හරින හෝ ඒ උපවගන්තිය යටතේ සාවද්‍ය තොරතුරු සපයන

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු හතරකට නොවැඩි කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නඩු පැවරීමක දී යම් තැනැත්තකු—

(අ) දැනුම් දෙනු ලැබූ විට, තෝරා ගැනීමේ පරීක්ෂණයක් සඳහා වාර්තා කිරීම පැහැර හැර ඇති බවට ;

(ආ) ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට බැඳෙන ලෙස විධාන කරනු ලැබූ විට, එසේ බැඳීම පැහැර හැර ඇති බවට ;

(ඇ) 4 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ සපයන ලෙස ඔහුට නියම කරනු ලැබ ඇති තොරතුරු සැපයීම පැහැර හැර ඇති බවට

බලධරයාගේ අත්සන යටතේ වූ සහතිකයක්, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතුය.

7. පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය :— නියෝග.

(අ) 4 වන වගන්තිය යටතේ ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට බඳවා ගැනීම සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණය පවත්වනු ලබන ආකාරය ;

(ආ) ජාතික සේවයෙන් නිදහස් කිරීම ලබා ගන්නා ආකාරය ;

(ඇ) ජාතික සේවයට හෝ ස්වේච්ඡා සේවයට හෝ යටත් තැනැත්තන් විසින්, සපයනු ලැබීමට නියමිත තොරතුරු ;

(ඈ) ලේඛන පවත්වා ගෙන යාම ;

(ඉ) ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයෙහි සේවය සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන තැනැත්තන් තෝරා ගන්නා ආකාරය ; සහ

(ඊ) නියම කරනු ලැබිය යුතු යයි මේ කොටසින් ප්‍රකාශිත හෝ නියමිත යම් කාරණයක්.

නියමයක් කිරීමේ බලය.

8. 4 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන කිසිම නියමයක්, පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබ, ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ ඇත්නම් මිස, බලාත්මක නොවිය යුතු ය.

මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා "අමාත්‍යවරයා" යන්නෙන්, මිනිස්බලය උපයෝගි කර ගැනීමේ සහ පුහුණු කිරීමේ විෂයය හා කර්තව්‍යය භාර අමාත්‍යවරයා අදහස් වේ.

4 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම, අදාළ තැනැත්තන් ගණයක සාමාජිකයන් වෙත පොදුවේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් හෝ ඒ ගණයේ සාමාජිකයකු වෙත පෞද්ගලිකව ලියාපදිංචි තැපෑල් මගින් යවන ලිපියක් මගින් හෝ දෙනු ලැබිය හැකි ය.

## III වන කොටස

## මිනිස්බල සංචිත කාර්ය භාර මණ්ඩලය

මිනිස් බල සංචිත කාර්ය භාර මණ්ඩලය පිහිටුවීම.

9. ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයකින් නිශ්චිතව නියම කරනු ලබන සාමාජික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මිනිස්බල සංචිත කාර්ය භාර මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඔවුන් අතුරින් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

ජනාධිපතිවරයාගේ බලතල.

10. (1) මණ්ඩලය වෙත පවරා ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කර දී ඇති යම් නිශ්චිත බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් අමාත්‍යවරයා විසින්, ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, මණ්ඩලයේ කවර වූ හෝ සාමාජිකයකුට පවරා දෙනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ඇතුළු මණ්ඩලයේ පරිපාලනය සම්බන්ධයෙන් සියලු කාරණා, එහි කාරක සභා පත් කිරීම සහ මණ්ඩලයේ බලතල එම කාරක සභාවලට පැවරීම, තත් කාර්යය සඳහා සාදනු ලබන නියෝග මගින් නියම කළ යුතු ය.

(3) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ආණ්ඩුවේ වෙනත් යම් ආයතනයක සාමාන්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් වන යම් සේවාවක් ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතයට, ජාතික ශිෂ්‍ය භට බලකායට, ජාතික සහායක හමුදාවට හෝ යම් පරිපූරක හමුදාවකට ව්‍යාප්ත කරන ලෙස, ජනාධිපතිවරයා විසින් එවැනි යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, මණ්ඩලයකට හෝ ආයතනයකට නියම කරනු ලැබිය හැකිය.

**11.** ජනාධිපතිවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව මණ්ඩලයට පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ඇත්තේ ය :— මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

(අ) (i) රටේ ආරක්ෂක අවශ්‍යතා සඳහා එක කිනම් අවස්ථාවක එවට ද සන්නද්ධ සේවා සහ පොලිස් සේවාව තර කිරීම පිණිස ප්‍රමාණවත් මිනිස්බල සංචිත උපයෝගී කර ගැනීම :

(ii) සන්නද්ධ සේවාවලට සහ පොලිස් සේවයට සහාය වීම සඳහා පරිපූරක හමුදා පිහිටුවීම ;

(iii) ශිෂ්‍යයන්ට පූර්ව යුද පුහුණුවක් ලබාදීම සඳහා සැලසුම් පිළියෙල කිරීම ;

(ආ) (අ) ඡේදය යටතේ පිළියෙල කරනු ලැබ, ජනාධිපතිවරයා විසින් අනුමත කරනු ලැබූ සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණය කිරීම සහ ඒ පිළිබඳව වාර්තා කිරීම ;

(ඇ) ජනාධිපතිවරයා විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව ජාතික සන්නද්ධ මිනිස් බල සංචිතය, ජාතික ශිෂ්‍ය භට බලකාය, ජාතික සහායක හමුදාව සහ වෙනත් පරිපූරක හමුදාවල කටයුතු සම්බන්ධීකරණය කිරීම ;

(ඈ) ජාතික සන්නද්ධ මිනිස් බල සංචිතය, ජාතික ශිෂ්‍ය භට බලකාය, ජාතික සහායක හමුදාව සහ වෙනත් පරිපූරක හමුදාවල සාමාජිකයන්ගේ පුහුණුව අධීක්ෂණය කිරීම ;

(ඉ) ජාතික සන්නද්ධ මිනිස් බල සංචිතයෙහි, ජාතික ශිෂ්‍ය භට බලකායෙහි, ජාතික සහායක හමුදාවෙහි සහ වෙනත් පරිපූරක හමුදාවන්හි භට සංඛ්‍යාව ජනාධිපතිවරයා විසින් නිශ්චිතව දක්වා ඇති මට්ටම් වලින් පවත්වාගෙන යන බවට වගබලා ගැනීම සහ ඒ පිළිබඳව ජනාධිපතිවරයාට වාර්තා කිරීම ;

(ඊ) යම් අවස්ථාවක දී උපයෝගී කර ගනු ලැබීම සඳහා ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතය සූදානම්ව තිබීම පිළිබඳව වාර්තා කිරීම ; සහ

(උ) ජාතික සන්නද්ධ මිනිස්බල සංචිතය, ජාතික ශිෂ්‍ය භට බලකාය, ජාතික සහායක හමුදාව සහ වෙනත් යම් පරිපූරක හමුදා අධීක්ෂණය කොට වරින් වර ඒවා පිළිබඳව ජනාධිපතිවරයාට වාර්තා කිරීම.

**12.** පනතේ මේ කොටස යටතේ පහත දැක්වෙන කර්තව්‍ය සහ කාර්ය බලධරයා සතු වේ :— මේ කොටස යටතේ බලධරයා සතු කාර්ය.

(අ) මේ කොටසේ විධිවිධානවලට සහ එයට අදාළව සාදනු ලැබූ යම් නියෝගවලට අනුකූලව ක්‍රියා කරන බවට වගබලා ගැනීම ;

(ආ) මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කරනු ලබන බවට වගබලා ගැනීම ;

(ඇ) සිය කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය විය හැකි තොරතුරු මණ්ඩලය වෙත සැපයීම.

මේ පනතේ මේ කොටසේ, කාර්ය සඳහා, “ අමාත්‍යවරයා ” යන්නෙන්, මිනිස් බල සංචිත කාර්ය භාර මණ්ඩල විෂයය සහ කාර්යය භාර අමාත්‍යවරයා අදහස් වේ.

3—ඒ 086186 (85/10)

## IV වන කොටස

## ජාතික සන්නද්ධ මිනිස් බල සංචිතය

**ජාතික සන්නද්ධ මිනිස් බල සංචිතය.**

**13.** (1) (මෙහි මින්මතු "සංචිතය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික සන්නද්ධ මිනිස් බල සංචිතය යනුවෙන් හඳුන්වනු ලබන සංචිතයක් මේ පනතේ විධිවිධානවලට අනුකූලව බඳවා ගනු ලැබ පවත්වා ගෙන යා යුතු ය. එය ජනාධිපතිවරයා විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ ඒකකවලින් සංයුක්ත විය යුතු අතර එසේම තීරණය කරනු ලැබිය හැකි භට සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(2) සංචිතයෙහි අධ්‍යක්ෂ ජනරාල් ලෙස සුදුසු තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර සංචිතයෙහි පරිපාලනය, පුහුණුව, විනය, කාර්යක්ෂමතාව සහ සංචිතයට අදාළ වෙනත් සියළුම කරුණු සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

**සංචිතයෙහි සාමාජිකයන් පත් කිරීම සහ උසස් කිරීම.**

**14.** (1) සංචිතයේ නිලධරයන් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයන් ඔවුන්ගේ පත්වීමෙහි නිශ්චිතව දක්වා ඇති දින සිට සංචිතයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංචිතයේ නිලධරයන් නිල තත්ත්වයෙන් උසස් කිරීම හෝ ඉහළ දැමීම, ජනාධිපතිවරයා විසින් කලින් කල සිදු කළ හැකි ය.

(4) සංචිතයේ අනෙකුත් සාමාජිකයන්ගේ ව්‍යුහය සහ නිල තත්ත්වය නියම කරනු ලැබේ.

**සංචිතය ජාතික යුද පුහුණු කිරීමේ ආයතනයක් විය යුතු බව.**

**15.** (1) සංචිතය ජාතික යුද පුහුණු ආයතනයක් විය යුතු අතර, එය විසින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට යුද පුහුණුව ලබා දිය යුතු ය.

(2) සන්නද්ධ සේවා සහ පොලිස් සේවාව තර කිරීම සඳහා සංචිතයේ භටයන් සංචිතය විසින් සැපයිය යුතු ය.

**සංචිතයේ සාමාජිකයන් මාරු කිරීම.**

**16.** (1) මූලික පුහුණුවීමේ කාල සීමාව අවසන් කොට සංචිතයේ ආරම්භක සේවයේ, පූර්ණ කාලීන සේවයේ හෝ මිනිස්බල උපයෝගිතා සේවයේ යෙදී සිටින සංචිතයේ කවර වූ හෝ සාමාජිකයකු, සන්නද්ධ සේවාවල හෝ පොලිස් සේවයේ හෝ පුද්ගල සංචිත භටයන් ලෙස හෝ උපයෝගී කර ගත් සංචිත ඒකක ලෙස සන්නද්ධ සේවාවලට හෝ පොලිස් සේවයට හෝ මාරු කරනු ලැබිය හැකි ය.

(2) සංචිතයේ යම් සාමාජිකයකු සන්නද්ධ සේවාවලින් එක සේවාවකට හෝ පොලිස් සේවයට හෝ මාරු කරනු ලැබූ විට, සිවිල් වරදකරුවන් සම්බන්ධයෙන් වූ නඩු විභාගයට සහ දඬුවමට අදාළවන යම් නීති, නියෝග සහ රීති නොවන්නා වූ ද, එම සාමාජිකයා මාරු කරනු ලැබූ සන්නද්ධ සේවාවට හෝ පොලිස් සේවයට හෝ තත් කාලයෙහි අදාළ වන්නා වූ ද, නීති, නියෝග සහ රීති එම සාමාජිකයාට සහ එම සාමාජිකයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ මාරු කරනු ලැබූ සංචිතයේ යම් සාමාජිකයකු ආපසු සංචිතයට මාරු කරනු ලැබිය හැකි ය.

(4) (අ) (1) වන උපවගන්තිය යටතේ සංචිතයේ යම් සාමාජිකයකු මාරු කිරීම ; සහ

(ආ) (3) වන උපවගන්තිය යටතේ යම් සාමාජිකයකු ආපසු මාරු කිරීම

සඳහා වූ කාර්ය පටිපාටිය සහ එම මාරු කිරීම්වලට අදාළ කොන්දේසි, නියම කරනු ලැබිය යුතු ය.

පුහුණු කිරීමේ කොන්දේසි ආදිය මණ්ඩලය විසින් නිශ්චය කොට දැක්විය යුතු බව.

**17.** සංචිතයේ සාමාජිකයන් පුහුණු කිරීම සහ ඔවුන්ගේ කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් වූ කොන්දේසි ද සංචිතයේ සාමාජිකයකු කාර්යක්ෂම වූවකු ලෙස සමත් කරනු ලැබීමට පෙර ඔහු ලබා ගත යුතු ප්‍රවීණත්වයේ ප්‍රමාණය ද මණ්ඩලය විසින් මිනිස් බල සංචිත අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා, නිශ්චය කොට දැක්විය යුතු ය.

සංචිතයේ ඒකක ආදිය සන්නද්ධ සේවාවලට සහ පොලිස් සේවයට පැවරීමට ජනාධිපතිවරයාට ඇති බලය.

**18.** (1) ජනාධිපතිවරයා විසින්, ජාතික ආරක්ෂාවේ යහපත උදෙසා අවශ්‍ය යයි සලකනු ලබන විට, අවස්ථාවෝචිත පරිදි සන්නද්ධ සේවාවලට හෝ පොලිස් සේවයට හෝ සහාය වීම පිණිස, සංචිතයේ යම් ඒකකයක් පවරනු ලැබිය යුතු ය.

(2) සංචිතයේ යම් ඒකකයක් සන්නද්ධ සේවාවලට හෝ පොලිස් සේවයට සහාය වීම පිණිස (1) වන උපවගන්තිය යටතේ පවරනු ලැබූ විට, එම ඒකකය, සම්බන්ධයෙන් ක්‍රියාකාරී විධාන සන්නද්ධ සේවාවල හෝ පොලිස් සේවයේ හෝ නිලධරයකු විසින් කළ යුතු ය:

එසේ වුවද, හැකි සෑම අවස්ථාවකම එම ඒකකය, සංචිතයේ සාමාජිකයකු විසින් මෙහෙයවිය යුතු ය.

සංචිතයේ සාමාජිකයන් ආරම්භක සේවයට සහ අතිරේක සේවයට බැඳී සිටින බව.

**19.** සංචිතයේ සෑම සාමාජිකයකුම—

(අ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නිරණය කරනු ලැබිය හැකි පරිදි වූ ආකාරයට සහ එක් අවුරුද්දකට නොවැඩි යම් කාලසීමාවක් සඳහා වූ ද මූලික පුහුණුවක් ඇතුළත් වූ ද ආරම්භක සේවයක් ද,

(ආ) ආරම්භක සේවය සම්පූර්ණ කිරීමෙන් පසු, ගැසට් පත්‍රයේ පළකරන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් නිරණය කරනු ලැබිය හැකි ආකාරයට වර්ෂයකට මුළුමණින් දින විසි එකකට නොවැඩි වූ අතිරේක සේවයක් ද ඉටු

කිරීමට යටත් විය යුතු ය:

එසේ වුවද, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නිශ්චය කරන ලද අතිරේක සේවා කාලය ඉක්මවන යම් කාලයක් සේවය ඉටු කිරීමට සාමාජිකයන්ට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය හැකි ය.

මිනිස් බල උපයෝගිතා සේවය සඳහා සංචිතය කැඳවීම.

**20.** (1) (අ) යුද්ධයක් පවතින කාලයක දී ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සඳහා ; හෝ

(ආ) යම් කැරැල්ලක් හෝ කැරලි කෝලාහලයක් හෝ වෙනත් මහජන කැළඹීමක් වැළැක්වීම හෝ මැඩ පැවැත්වීම සඳහා,

ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ආඥාවක් මගින් මිනිස් බල උපයෝගිතා සේවය සඳහා සංචිතය කැඳවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක දී, සංචිතයේ යම් සාමාජිකයකුගේ ආරම්භක සේවයේ, සංචිත සේවයේ හෝ පූර්ණ කාලීන සේවයේ සේවා කාල සීමාව අවසානයේ දී ඔහු මුදා හරිනු නොලැබිය යුතු අතර ඒ සාමාජිකයා සංචිතයේ දිගටම සේවයේ නියුක්තව සිටිය යුතු ය:

එසේ වුවද මණ්ඩලය විසින් ඕනෑම අවස්ථාවක දී සංචිතයේ යම් සාමාජිකයකු මිනිස් බල උපයෝගිතා සේවයෙන් මුදා හැරීමට බලය දිය හැකි ය.

(3) සංචිතයේ සෑම සාමාජිකයෙකුම (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබූ විට දී සංචිතයේ හෝ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි සන්නද්ධ සේවාවලින් යම් සේවාවක හෝ පොලිස් සේවයෙහි හෝ සේවය කළ යුතු ය.

සංචිතයේ සාමාජිකයන් ගේ සේවා කාලය.

21. (1) පූර්ණකාලීන සේවයේ නියුක්ත සාමාජිකයන්ගේ හෝ සන්නද්ධ සේවාවලින් හෝ පොලිස් සේවයෙන් හෝ ද්විතීය නය කරන ලද සාමාජිකයන්ගේ හැර, සංචිතයේ සාමාජිකයන්ගේ සේවා කාලය අවුරුදු දහයක් විය යුතු ය:

එසේ වුවද, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත වැඩිදුර සේවා කාලයක් සඳහා යම් සාමාජිකයකුට නැවත බැඳිය හැකි ය.

(2) සංචිතයේ යම් සාමාජිකයකු සංචිතයෙන් නිදහස් කිරීම හෝ සේවයෙන් පහ කිරීම හෝ සිදු කළ හැකි ය.

සේවා කාලය අවසානයේ දී කලින් කළ සේවයට නැවත පැමිණීමට ඇති අයිතිය.

22. (1) ආරම්භක සේවය සඳහා හෝ සංචිත සේවය සඳහා හෝ මිනිස් බල උපයෝගිතා සේවය සඳහා හෝ තැනැත්තකු කැඳවනු ලැබූ දිනයට පෙරාතුවම යටත් පිරිසෙයින් මාස හයක අඛණ්ඩ කාලයක් ඒ තැනැත්තා යම් සේවා යෝජකයකු යටතේ සේවයේ යොදවනු ලැබ සිටි අවස්ථාවක, ඒ තැනැත්තාගේ යට කී ආරම්භක සේවය හෝ සංචිත සේවය හෝ මිනිස්බල උපයෝගිතා සේවය හෝ අවසන් වූ පසු, ඒ තැනැත්තා අවස්ථාවෝචිත පරිදි සේවයේ දිගටම යොදවා ගැනීම හෝ නැවත සේවයෙහි පිහිටුවීම ඒ සේවා යෝජක විසින් කළ යුතු ය.

(2) ආරම්භක සේවය, සංචිත සේවය හෝ මිනිස් බල උපයෝගිතා සේවය සඳහා වාර්තා කරන සෑම සේවා නියුක්තයකු සම්බන්ධයෙන් ම, ඒ සේවා නියුක්තයා විසින් ඒ සේවය ඉටු කරනු ලබන කාලය තුළ දී (ඒ සේවා නියුක්තයා සම්බන්ධයෙන් ගෙවිය යුතු යයි යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ සේවා යෝජකයාට නියම කරනු ලැබිය හැකි සියලු දායක මුදල් ඇතුළුව) එම සේවා නියුක්තයාගේ වැටුප්, පඩිනඩි සහ දීමනා, සෑම සේවා යෝජකයකු විසින් ම ගෙවනු ලැබිය යුතු ය. ඒ සේවා යෝජක විසින් ඒ කාලය තුළ දී ඒ සේවා නියුක්තයා වෙත හෝ ඒ සේවා නියුක්තයා සම්බන්ධයෙන් හෝ ගෙවන ලද වැටුප්, පඩිනඩි, දීමනා සහ දායක මුදල් රජය විසින් ඒ සේවා යෝජක වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(3) යම් සේවා යෝජකයකු යටතේ සේවයේ නියුක්තව සිටි තැනැත්තකු ආරම්භක සේවය, සංචිත සේවය හෝ මිනිස්බල උපයෝගිතා සේවය සඳහා කැඳවනු ලැබුවා වූ ද ඒ තැනැත්තා ආරම්භක සේවය, සංචිත සේවය හෝ මිනිස්බල උපයෝගිතා සේවය ඉටු කරනු නොලැබුවේ නම් ගිවිසුමකට ඇතුළත් වූ කාල සීමාවක් සඳහා පමණක් ඒ සේවා නියුක්තියේ නියුක්තව සිටීමට හැකිව තිබුණා වූ ද අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධාන එම සේවා යෝජකයාට අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ තැනැත්තකු නැවත සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක දී හැකිතාක් දුරට එම තැනැත්තා ආරම්භක සේවය හෝ සංචිත සේවය හෝ මිනිස්බල උපයෝගිතා සේවය හෝ සඳහා කැඳවනු නොලැබුවේ නම් ඔහුට අදාළ විය හැකිව තිබුණු නියමයන් හා කොන්දේසිවලට වඩා ඔහුට වාසිදායක කමින් අඩු නොවන නියමයන් හා කොන්දේසි යටතේ සේවා යෝජකයා විසින්, ඔහු සේවයේ නියුක්ත කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන පිළිපැදීම පැහැර හරින යම් සේවායෝජකයකු වරදකට වරදකරු විය යුතු අතර, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු අතර සේවා යෝජකයා විසින් සේවයේ නියුක්ත කිරීම පැහැර හරිනු ලැබූ තැනැත්තාට අවසන් වරට පාරිශ්‍රමිකය ගෙවනු ලැබූ අනුපාතය අනුව, මාස තුනක පාරිශ්‍රමික මුදලට නොවැඩි මුදලක් ඔහුට ගෙවන ලෙස ඒ සේවායෝජකයා වරදකරු කළ අධිකරණය විසින් ඔහුට නියම කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ වූ නඩු පැවරීමක දී, මේ වගන්තියේ විධිවිධාන පිළිපැදීමට චූදිතයා අපොහොසත් වූ ආකාර දක්වමින් බලධරයාගේ අත්සන යටතේ වූ සහතිකයක් එහි අඩංගු කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂි වන්නේය.

සක්‍රිය සේවය සඳහා කැඳවනු ලැබූ විට සේවයෙන් පහ කිරීමට සේවා යෝජකයාට අයිතියක් නැති බව.

23. (1) සක්‍රිය සේවය සඳහා කැඳවනු ලැබූ තැනැත්තකු ගිවිසුම්ගත කාල සීමාවක් සඳහා පමණක් සේවයේ නියුක්ත කරනු ලැබ ඇත්නම් මිස, මේ පනත යටතේ සක්‍රිය සේවය සඳහා කැඳවනු ලැබීම හෝ කැඳවනු ලැබීමට යටත්වීම හේතු කොට ගෙන යම් කාර්යයක් හෝ වගකීමක් ඉටු කිරීම සඳහා යම් තැනැත්තකු යටත්වීමේ හෝ යටත් විය හැකි වීමේ හේතුව නිසාම පමණක් සහ ප්‍රධාන වශයෙන් එම හේතුව නිසාම, කිසිම සේවා යෝජකයකු විසින් ඒ තැනැත්තා සේවයෙන් පහ නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා, මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් ඉටු කළ යුතු යම් කාර්යයක් හෝ ඒ යටතේ වූ යම් වගකීමක් ඒ තැනැත්තා සේවයෙන් පහ කිරීම සඳහා මුල් වූ බව නැතහොත් දායක වූ බව ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, සේවයෙන් පහකිරීම සිදු කළේ එකී කාර්ය සහ වගකීම්වලට

සම්බන්ධ නැති හේතුවක් නිසා බවට සේවා යෝජකයා ඔප්පු කළ හොත් මිස, ඒ තැනැත්තා සේවයෙන් පහ කරනු ලැබ ඇත්තේ එකී කාර්ය සහ වගකීම්වල හේතුව නිසා බව සලකනු ලැබිය යුතු ය.

(3) සංචිතයේ සාමාජිකයකු එසේ සංචිතයේ සාමාජිකයකු වශයෙන් ඔහු සතු කාර්ය සහ වගකීම් හේතුකොටගෙන සේවයෙන් ඉවත් කරන යම් සේවායෝජකයකු වරදකට වරදකරු වන අතර, ලඝු නඩු විභාගයකින් පසු ඔහු එසේ වරදකරු කරනු ලැබීමේ දී මාස හයකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාරගාරගත කිරීම සහ ඒ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු අතර, සේවායෝජකයා විසින් ඒ තැනැත්තාට අවසන් වරට ගෙවිය යුතුව තිබුණු පාරිශ්‍රමිකය මත ගණන් බලනු ලබන මාස තුනක පාරිශ්‍රමිකයකට සමාන මුදලකට නොවැඩි මුදලක් එසේ සේවයෙන් ඉවත් කරනු ලැබූ තැනැත්තාට වන්දි මුදලක් ලෙස ගෙවිය යුතු යයි ඒ සේවායෝජකයා වරදකරු කරනු ලැබූ අධිකරණය විසින් සේවායෝජකයාට නියම කරනු ලැබිය හැකි ය.

**සන්නද්ධ සේවාවල හෝ පොලිස් සේවයේ සාමාජිකයන් සංචිතයේ සේවය සඳහා ද්විතීයනය කිරීම.**

24. සන්නද්ධ සේවාවල හෝ පොලිස් සේවයේ අහෝ යම් සාමාජිකයෙකු, තත් කාර්යය සඳහා නියම කරනු ලබනා සේවා කොන්දේසිවලට අනුකූලව සංචිතයේ සේවය සඳහා ද්විතීයනය කරනු ලැබිය හැකි ය.

**පූර්ණ කාලීන සේවය.**

25. තත් කාර්යය සඳහා නියම කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව සංචිතයේ යම් සාමාජිකයකු විසින් පූර්ණ කාලීනව සංචිතයේ සේවය කරනු ලැබිය හැකි ය.

**සංචිතයේ සාමාජිකයන්ට අදාළ නියමයන් හා කොන්දේසි.**

26. යම් සන්නද්ධ සේවයක හෝ පොලිස් සේවයක විනය පාලනය කිරීමට තත් කාලයෙහි බලපවත්නා නීතිය, සිවිල් වැරදි සම්බන්ධයෙන් නඩු විභාග කිරීමට හා දඬුවම් දීමට අදාළ ඒ නීතියේ විධිවිධාන හැර, එම සන්නද්ධ සේවයෙහි හෝ පොලිස් සේවයෙහි සාමාජිකයනට අදාළ වන ආකාරයට ආරම්භක සේවය, සංචිත සේවය, පූර්ණකාලීන සේවය හෝ මිනිස්බල උපයෝගිතා සේවය ඉටු කරන සංචිතයේ සාමාජිකයින් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**සංචිතයේ සාමාජිකයන්ට වැටුප් ආදිය නිර්ණය කළ යුතු බව.**

27. නිර්ණය කරනු ලැබිය හැකි පරිදි යම් වැටුප් සහ දීමනා සංචිතයේ සාමාජිකයන්ට ගෙවිය යුතු ය.

**සංචිතයේ සියළු දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරෙන බව.**

28. සංචිතයේ තනි පුද්ගල සාමාජිකයන්ගේ දේපළ හැර සංචිතයට අයත් සියළු දේපළ ද සංචිතයට හෝ සංචිතයේ යම් කොටසකට අය විය යුතු හෝ අත්විය යුතු මුදල් හෝ දේපළ නඩු පවරා අය කර ගැනීමේ හෝ අත් කර ගැනීමේ තනි අයිතිය ද නඩු පැවරීමේ, ගිවිසුම්වලට ඇතුළත්වීමේ, ඔප්පු ලිවීමේ සහ ඒ දේපළ වලට සම්බන්ධ සියළු නීත්‍යානුකූල ක්‍රියා කිරීමේ බලය සහිතව, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරේ. තවද, සංචිතයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ වගන්තිය ප්‍රකාර පවරන ලද යම් සිවිල්

හෝ අපරාධ නඩු කටයුත්තක්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මරණය, ඉල්ලා අස්වීම, විශ්‍රාම ගැනීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතු කොට ගෙන අත්හැර දැමීම හෝ නතර කිරීම කරනු නොලැබිය යුතු අතර ඒවා ඔහුගේ ධුරයේ අනුප්‍රාප්තිකයා විසින් සහ එම අනුප්‍රාප්තිකයාගේ නමින් නොකඩවා පවත්වා ගෙන යා හැකි ය.

සේවය සඳහා වාර්තා කිරීම පැහැර හැරීම වරදක් බව.

29. (1) ආරම්භක සේවය සඳහා වාර්තා කිරීමට කැඳවනු ලැබූ විට එය පැහැර හරින සංචිතයේ යම් සාමාජිකයකු වරදකට වරදකරු වන අතර, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු හතරකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් වේ.

(2) (i) පොලිස් සේවයේ සංචිත සේවයෙහි හෝ උපයෝගිතා සේවයෙහි හෝ සේවය සඳහා වාර්තා කිරීම පැහැර හරින සංචිතයේ යම් සාමාජිකයකු වරදක් කරන අතර, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු හතරකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

(ii) සන්නද්ධ සේවාවල සංචිත සේවය හෝ උපයෝගිතා සේවය හෝ සඳහා වාර්තා කිරීම පැහැර හරින සංචිතයේ යම් සාමාජිකයකු වරදක් කරන අතර, අවස්ථාවෝචිත පරිදි යුද්ධ හමුදා පනත, නාවික හමුදා පනත හෝ ගුවන් හමුදා පනත යටතේ කැඳවනු ලැබූ යුද්ධාධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු හතරකට නොවැඩි කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ අවස්ථාවෝචිත පරිදි අවමාන සහිතව සේවයෙන් ඉවත් කොට පහ කරනු ලැබීමට හෝ නින්දිත ලෙස මුදා හරිනු ලැබීමට හෝ යුද්ධ හමුදා පනතේ 133 වන වගන්තියෙහි හෝ නාවික හමුදා පනතේ 120 වන වගන්තියෙහි හෝ ගුවන් හමුදා පනතේ 133 වන වගන්තියෙහි දක්වා ඇති ඊට වඩා ලිහිල් දඬුවමකට හෝ ඔහු යටත් විය යුතු ය.

බලධරයාගේ සහතිකය බැලූ බැල්මට ඔප්පු වන සාක්ෂි බව.

30. 29 වන වගන්තිය යටතේ පවරන ලද නඩුවක දී, සංචිතයේ සාමාජිකයකු කැඳවනු ලැබූ විට දී සේවය සඳහා පැමිණීම පැහැර හැරී බවට බලධරයාගේ අත්සන යටතේ වූ සහතිකයක්, ඒ සහතිකයේ අඩංගු කරුණු පිළිබඳව බැලූ බැල්මට ඔප්පු වන සාක්ෂි වන්නේ ය.

ඇතැම් පනත් සංචිතයේ සාමාජිකයන්ට අදාළ නොවන බව.

31. ගිනි අවි ආඥාපනතේ, පුපුරන ද්‍රව්‍ය පනතේ සහ 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනතේ අඩංගු කිසිවක්, සංචිතයේ සාමාජිකයන් පෙළපාළිවල යෙදී සිටින විට දී හෝ එවැනි සාමාජිකයන් වශයෙන් තම රාජකාරිය ඉටු කරන විට දී ඔවුන්ට හෝ ඔවුන් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

ගිනි අවි ආඥා පනතේ 46 වන වගන්තිය මද වශයෙන් වෙනස් කොට බලපැවැත් වීම.

32. ගිනි අවි ආඥාපනතේ 46 වන වගන්තියෙහි මහ රැජිනගේ හමුදා සම්බන්ධයෙන් කර ඇති සඳහනට, සංචිතයේ සාමාජිකයන් සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ද ඇතුළත් ලෙස එම වගන්තිය බලාත්මක විය යුතු ය.

වෙඩි පිටි සහ යුද පුහුණු පනතේ 3 (1) වගන්තිය මඳ වශයෙන් වෙනස් කොට බලපැවැත් වීම.

**33.** වෙඩි පිටි සහ යුද පුහුණු පනතේ 3(1) වන වගන්තියේ ඇති 'ලංකා නාවික, යුධ හමුදා සහ ගුවන් හමුදා' සම්බන්ධයෙන් කර ඇති සඳහනට, සංචිතය ගැන කරන ලද සඳහනක් ද ඇතුළත් ලෙස ඒ වගන්තිය බලාත්මක විය යුතු ය.

නියෝග.

**34.** පහත සඳහන් සියලුම කරුණු හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය :—

(අ) සංචිතයේ ඒකක සහ භට සංඛ්‍යාව ;

(ආ) සංචිතයේ සාමාජිකයන්ගේ නිල ව්‍යූහය ;

(ඇ) සංචිතයේ සාමාජිකයන්ගේ නිල ඇඳුම් ;

(ඈ) සංචිතයේ සාමාජිකයන් පුහුණු කිරීම ;

(ඉ) සංචිතයේ සාමාජිකයන්ගේ විනය ;

(ඊ) සංචිතයේ යම් ඒකකයක් හෝ ඉන් කොටසක් විසුරුවා හැරීම ;

(උ) සංචිතයේ පරිපාලනය ;

(ඌ) නියම කරනු ලැබීමට මේ පනතේ මේ කොටසෙහි ප්‍රකාශිත හෝ නියමිත යම් කරුණක් ;

(එ) යුද්ධාධිකරණ රැස්වීම් සහ ඒවායේ සජ්ජිතය ;

(ඒ) යුද්ධාධිකරණවල විභාග කල් තැබීම, ඒවා විසුරුවා හැරීම සහ ඒවායේ රැස්වීම් ;

(ඔ) යුද්ධාධිකරණ නඩු විභාගවල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ඕ) යුද්ධාධිකරණවල තීරණ සහ දඬුවම් ස්ථිර කිරීම සහ ප්‍රතිශෝධනය කිරීම ;

(ක) යුද්ධාධිකරණ, බන්ධනාගාරගත කිරීම් සහ රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන යටතේ සාදනු ලබන නියෝගවල ආකෘති ;

(ග) මේ පනතේ මේ කොටසින් නියෝග සෑදීම සඳහා බලය දී තිබෙන්නේ යම් කරුණු සඳහා ද එවැනි යම් කරුණක්.

ආයුධ ආදිය නිකුත් කිරීම.

**35.** සංචිතයේ සාමාජිකයින්ට ආයුධ සහ වෙඩි ද්‍රව්‍ය නිකුත් කිරීම රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන පරිදි පාලනය කළ යුතු ය.

මේ පනතේ මේ කොටසේ කාර්යය සඳහා “අමාත්‍යවරයා” යන්නෙන් මිනිස්බලය උපයෝගී කර ගැනීමේ සහ පුහුණු කිරීමේ විෂයය සහ කර්තව්‍යය භාර අමාත්‍යවරයා අදහස් වේ.

## V වන කොටස

## ජාතික ශිෂ්‍ය භට බලකාය

ජාතික ශිෂ්‍ය භට බලකාය.

**36.** මේ පනතේ විධිවිධානවලට අනුකූලව (මෙහි මින් මතු “බලකාය” යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ශිෂ්‍ය භට බලකාය නම් වූ බලකායක් පිහිටුවා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

බලකායේ ඒකක සහ භට සංඛ්‍යාව ජනාධිපතිවරයා විසින් තීරණය කළ යුතු බව.

**37.** (1) ජනාධිපතිවරයා විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ ඒකකවලින් සහ භට සංඛ්‍යාවකින් බලකාය සමන්විත විය යුතු ය.

(2) බලකායේ ව්‍යුහය සහ නිල තත්ත්ව, ඒ නිල තත්ත්වවලට කරනු ලබන පත්වීම්, ඒ නිල තත්ත්වවලින් උසස් කිරීම් සහ ඒවායින් පහත දැමීම ද නියම කරනු ලබන පරිදි විය යුතු ය.

බලකායේ අධ්‍යක්ෂවරයා.

**38.** ජනාධිපතිවරයා විසින් සුදුසු තැනැත්තකු බලකායේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු ලැබිය යුතු අතර බලකායේ පරිපාලනය, පුහුණු කිරීම, විනය සහ කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

බලකායේ නිලධරයන් ජනාධිපතිවරයා විසින් පත් කළ යුතු බව.

**39.** බලකායේ නිලධරයන් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

පුහුණු කිරීමේ තත්ත්වය මණ්ඩලය විසින් නිශ්චිතව දැක්විය යුතු බව.

**40.** (1) බලකාය විසින් ශිෂ්‍යයන්ට පූර්ව යුද පුහුණුව සහ ප්‍රජා පුහුණුව ලබාදිය යුතු ය.

(2) ශිෂ්‍ය භටයකු කාර්යක්ෂම භටයකු ලෙස සමත් කරනු ලැබීමට පෙර ඔහු ලබාගත යුතු කාර්යක්ෂමතාවයේ තත්ත්වය සහ ප්‍රවීණතාවයේ ප්‍රමාණය කවරේදැයි, මණ්ඩලය විසින්, බලකායේ අධ්‍යක්ෂවරයා විමසා නිශ්චිතව දැක්විය යුතු ය.

බලකායේ සේවය සඳහා නිලධරයන් ආදීන් ද්විතියකය කිරීම.

**41.** බලකායේ පූර්ණකාලීන සේවය හෝ අර්ධකාලීන සේවය සඳහා සන්නද්ධ හමුදාවල හෝ පොලිස් සේවයේ හෝ සංවිතයේ කවර හෝ සාමාජිකයකු තත්කාර්යය සඳහා නිශ්චය කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, පත් කරනු ලැබිය හැකි ය.

බඳවා ගනු ලැබූ කාල සීමාව අවසානයේ දී ශිෂ්‍ය භටයන් නිදහස් කළ යුතු බව.

**42.** (1) මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගවලට යටත්ව, සෑම ශිෂ්‍ය භටයකුම ඔහු බඳවා ගනු ලැබූ කාලසීමාව අවසානයේ දී බලකායෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) කවර හෝ ශිෂ්‍ය භටයකු විසින් සිදු කරන ලද විනය කඩ කිරීමක් මත අධ්‍යක්ෂවරයා විසින් ඒ ශිෂ්‍ය භටයා සේවයෙන් පහ කරනු ලැබිය හැකි ය.

බලකායේ ශිෂ්‍ය භටයන්ගේ විනය.

**43.** කවර හෝ ශිෂ්‍ය භටයකු—

(අ) යම් නිලධරයකු විසින් පෞද්ගලිකවම දෙන ලද හෝ දන්වන ලද නීත්‍යනුකූල අණකට, ඕනෑකමින්ම අධිකාරය නොතකීමක් ලෙස පෙනෙන ආකාරයට, අකීකරු වුවහොත්, හෝ

(ආ) මේ පනත යටතේ කරනු ලැබූ යම් නියමයක් හෝ සාදනු ලැබූ නියෝගයක් උල්ලංඝනය කළහොත් හෝ එවැන්නකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරියහොත්, හෝ

නියම කොට ඇති ආකාරයට ඒ ශිෂ්‍ය භටයා ශික්ෂණය කරනු ලැබිය යුතු ය.

බලකාය සක්‍රිය සේවය සඳහා කැඳවනු නොලැබිය යුතු බව.

**44.** බලකාය සක්‍රිය සේවය සඳහා කැඳවනු නොලැබිය යුතු ය. එහෙත් මිනිස් බල උපයෝගිතා සේවය සඳහා සංචිතයේ සාමාජික යන් කැඳවීම පිණිස විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් බලකායේ නිලධරයන් මිනිස් බල උපයෝගිතා සේවය සඳහා කැඳවනු ලැබිය හැකි ය.

ඇතැම් ශිෂ්‍ය භටයන් බලකායේ ශිෂ්‍ය භටයන් ලෙස සැලකිය යුතු බව.

**45.** මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුවම වූ දිනයෙහි, ශ්‍රී ලංකා යුද හමුදා ශිෂ්‍ය භට බලකායට හෝ පොලිස් ශිෂ්‍ය භට බලකායට ශිෂ්‍ය භටයන් සේ බඳවා ගනු ලැබ සිටි සියලු තැනැත්තන් මේ පනත ආරම්භවීමේ දින සිට ශිෂ්‍ය භට බලකායට බඳවා ගනු ලැබූ ශිෂ්‍ය භටයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ගවයන් යේ දීමනා අමාත්‍යවරයා විසින් තීරණය කළ බලකායේ නිලධරයන් ගේ සහ ශිෂ්‍ය යුතු බව.

**46.** අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව බලකායේ නිලධරයන්ගේ සහ ශිෂ්‍ය භට යන්ගේ දීමනා තීරණය කළ යුතු ය.

බලකායේ දේපළ බලකායේ අධ්‍යක්ෂ වරයා වෙත සතුවන බව.

**47.** බලකායේ, තනි පුද්ගල සාමාජිකයන්ගේ දේපළ හැර, බලකායට අයත් සියලු දේපළ ද බලකායට හෝ එහි යම් කොටස කට අයවිය යුතු මුදල් හෝ අත්විය යුතු දේපළ නඩු පවරා අයකර හෝ අත්කර ගැනීමේ තනි අයිතිය ද නඩු පැවරීමේ, ගිවිසුම්වලට එළඹීමේ සහ ඔප්පු ලිවීමේ පූර්ණ බලය සහ ඒ දේපළට අදාළ අනෙකුත් සියලුම නීත්‍යනුකූල දේවල් කිරීමේ පූර්ණ බලය සහිතව තත් කාලයේ අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන අතර බලකායේ අධ්‍යක්ෂවරයා විසින් මේ වගන්තියේ ප්‍රකාර පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් අධ්‍යක්ෂවරයා මිය යෑම, ඉල්ලා අස් වීම, සේවයෙන් විශ්‍රාම යෑම හෝ ධුරයෙන් ඉවත් කිරීම යන හේතු නිසා අත්හැර දැමීම හෝ නතර කිරීම නො කළ යුතු අතර ඔහුගේ ධුරයේ අනුප්‍රාප්තිකයා විසින් සහ ඒ අනුප්‍රාප්තිකයාගේ නමින් දිගටම පවත්වාගෙන යා හැකි ය.

ඇතැම් පනත් බලකායේ නිලධරයන්ට සහ ශිෂ්‍ය භටයන්ට අදාළ නොවන බව.

**48.** ගිනි අවි ආඥාපනතේ, පුපුරන ද්‍රව්‍ය පනතේ සහ 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනතේ අඩංගු කිසිවක්, බලකායේ නිලධරයන් සහ ශිෂ්‍ය භටයන් පෙළපාළිවල ගමන් ගන්නා විට දී සහ ඔවුන්ගේ රාජකාරි ඉටු කරන විටදී ඔවුන්ට හෝ ඔවුන් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය.

බලකායේ නිලධරයන් සහ ශිෂ්‍ය භටයන් ද ඇතුලත්වන ලෙස ගිනි අවි ආඥාපනත වෙනස් කිරීම.

**49.** ගිනි අවි ආඥාපනතේ 46 වන වගන්තියේ මහ රැජිනගේ හමුදා සම්බන්ධයෙන් කර ඇති සඳහනට, බලකායේ නිලධරයන් සහ ශිෂ්‍ය භටයන් සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ද ඇතුළත් වන ලෙස එම වගන්තිය බලාත්මක විය යුතු ය.

IV වන කොටස අදාළ කිරීම.

**50.** ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍ය වරයා විසින් ශිෂ්‍ය භටයන් නොවන බලකායේ සාමාජිකයන්ට අදාළ වන පරිදි මේ පනතේ IV වන කොටසේ විධිවිධාන කිසිවක් ව්‍යාප්ත කරනු ලැබිය හැකි ය. තව ද යම් විධිවිධානයක් එලෙස

ව්‍යාප්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ විධිවිධානයෙහි සංචිතයේ සාමාජිකයන් සම්බන්ධයෙන් කරන ලද සඳහනකට ශිෂ්‍ය භටයන් හැර බලකායේ සාමාජිකයන් සම්බන්ධයෙන් කරනු ලැබූ සඳහනක් ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

51. පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා හෝ නියෝග සාදනු ලැබිය හැකි ය :— නියෝග.

(අ) බලකායේ සංවිධානය, පාලනය, පරිපාලනය සහ විනය ;

(ආ) බලකායේ සාමාජිකයන්ගේ නිල ඇඳුම් ;

(ඇ) ශිෂ්‍ය භටයන් පුහුණු කිරීම ;

(ඈ) බලකායේ යම් ඒකකයක් සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් විසුරුවා හැරීම ;

(ඉ) ශිෂ්‍ය භට සාමාජිකත්වය සඳහා වයස සහ වෙනත් සුදුසුකම්, ශිෂ්‍ය භට නිලයේ උසස් කිරීම්, වැඩිදියුණු කිරීම් හෝ අඩු කිරීම් සහ ශිෂ්‍ය භටයන්ගේ සේවය අනවශ්‍ය සේ සැලකීම ;

(ඊ) ශිෂ්‍ය භටයකු හැර බලකායේ කවර හෝ සාමාජිකයකුගේ සේවය අවසන් කිරීම ;

(උ) නියම කළ යුතු යයි මේ පනතේ මේ කොටසේ ප්‍රකාශිත හෝ නියමිත යම් කාරණයක් ;

(ඌ) නියෝග සෑදිය යුතු යයි මෙම පනතේ මෙම කොටස මගින් නියම කරනු ලැබ ඇත්තේ යම් කරුණක් සම්බන්ධයෙන් ද ඒ කරුණ.

මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා—

"ශිෂ්‍යයා" යන්නෙන් වයස අවුරුදු දහසයට වැඩි වූ ද ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව පිහිටුවනු ලැබ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව අධ්‍යාපනය ලබා දෙන පාසැලක හෝ ආයතනයක ශිෂ්‍ය යකු වූ ද කවර වූ හෝ ශ්‍රී ලංකා පුරවැසියෙක් අදහස් වේ.

"සක්‍රිය සේවය" යන්නෙහි, යුධ හමුදා පනතෙහි 162 වන වගන්තියේ ඊට දී ඇති අර්ථයම ඇත.

"අමාත්‍යවරයා" යන්නෙන්, ජාතික ශිෂ්‍ය භට බලකාය පිළිබඳ විෂයය හා කර්තව්‍යය භාර අමාත්‍යවරයා අදහස් වේ.

## VI වන කොටස

## පරිපූරක හමුදා

52. (1) සන්නද්ධ සේවාවලට සහ පොලිස් සේවාවට ආධාර සහ උපකාර වීම සඳහා (මෙහි මින්මතු "පරිපූරක හමුදා" යනු වෙන් සඳහන් කරනු ලබන)— පරිපූරක හමුදා පිහිටුවීම.

(අ) ජාතික සහායක හමුදාව ;

(ආ) වෙනත් යම් සහායක හමුදාවක් ;

(ඇ) යම් උප යුද්ධ හමුදාවක් ;

(ඈ) ග්‍රාමාරක්ෂක හමුදාවක් ;

(ඉ) යම් සිවිල් ආරක්ෂක හමුදාවක්

ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන (මෙහි මින්මතු "පිහිටුවීමේ ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආඥාවක් මගින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවා පවත්වාගෙන යා හැකි ය.

(2) සෑම පිහිටුවීමේ ආඥාවක් මගින් ම—

(අ) ඒ පරිපූරක හමුදාවට නමක් සහ අභිධානයක් යෙදිය යුතු ය. තවද,

(ආ) එම පරිපූරක හමුදාවල අරමුණු නිශ්චිතව දැක්විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවීමේ ආඥාවක් කරනු ලැබූ විට ඒ ආඥාවේ නිශ්චිතව දක්වා ඇති අරමුණු සඳහා ඒ ආඥාවේ නිශ්චිතව දක්වා ඇති නාමය සහ අභිධානය යටතේ පරිපූරක හමුදාවක් පිහිටුවනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

පරිපූරක හමුදාවක් විසුරුවා හැරීම.

53. (1) ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන (මෙහි මින්මතු "විසුරුවා හැරීමේ ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආඥාවක් මගින් මේ පනතේ මේ කොටසේ ඉහතින් වූ විධිවිධාන යටතේ පිහිටුවනු ලැබූ යම් පරිපූරක හමුදාවක් සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් හෝ විසුරුවා හැරිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ වූ විසුරුවා හැරීමේ ආඥාවක් කළ විට, එකී ආඥාවේ නිශ්චිතව සඳහන් කර ඇති පරිපූරක හමුදාව නීත්‍යානුකූල ලෙස විසුරුවා හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

එවැනි පරිපූරක හමුදාවක සේනාවිධායකයකු පත් කිරීම.

54. ජනාධිපතිවරයා විසින් එක් එක් පරිපූරක හමුදාවේ සේනාවිධායක ලෙස සුදුසු තැනැත්තකු පත් කළ යුතු අතර, ඔහු ඒ පරිපූරක හමුදාවට අණදීම සම්බන්ධයෙන් වගකිව යුතු ය.

පදවිගත කළ හමුදාපතිවරයකු පත් කිරීම.

55. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල වලට හානියක් නොමැතිව පරිපූරක හමුදාවක සේනාවිධායකවරයා, ජනාධිපතිවරයා විසින් පදවිගත කළ හමුදාධිපතිවරයකුගේ ක්‍රියාකාරී විධානවලට සහ පාලනයට යටත් විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "පදවි ගත කළ හමුදාධිපතිවරයා" යන්නෙන් පහත දැක්වෙන තැනැත්තෙක් අදහස් වේ:—

(අ) යුද්ධ හමුදාවේ හමුදාධිපතිවරයා ;

(ආ) නාවික හමුදාවේ හමුදාධිපතිවරයා ;

(ඇ) ගුවන් හමුදාවේ හමුදාධිපතිවරයා ;

(ඇ) පොලිස්පතිවරයා ; හෝ

(ඉ) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් ජනාධිපතිවරයා විසින් නමින් හෝ නිලයෙන් පදවිගත කරන ලද යම් සුදුසු හා නිසි තැනැත්තෙක්.

56. පරිපූරක හමුදාවක යම් සාමාජිකයකු කාර්යක්ෂම අයකු වශයෙන් තීරණය කිරීමට පෙර ඔහු විසින් ලබාගත යුතු කාර්යක්ෂමතාවයේ කොන්දේසි සහ ප්‍රවීණත්වයේ ප්‍රමාණය මණ්ඩලය විසින්, පරිපූරක හමුදුවක සේනාවිධායකවරයා විමසීමෙන් පසු නිශ්චිතව දැක්විය යුතු ය. පරිපූරක හමුදා සඳහා වන කාර්යක්ෂමතා කොන්දේසි මණ්ඩලය විසින් නිශ්චිතව දැක්විය යුතු බව.

57. ජනාධිපතිවරයා විසින් කවර හෝ පරිපූරක හමුදුවක නිලධරයන් පත් කළ හැකි අතර, එම පත්වීමට අදාළ නියමයන් සහ කොන්දේසි නිශ්චිතව දක්විය යුතු ය. සාමාජිකයන් පත් කිරීමේ ක්‍රමය ආදිය.

58. (1) සන්නද්ධ සේවාවල හෝ පොලිස් සේවයේ කවර හෝ සාමාජිකයකු පරිපූරක හමුදාවක සේවය සඳහා ද්විතියනය කරනු ලැබිය හැකි ය. සන්නද්ධ සේවාවල හෝ පොලිස් සේවයේ සාමාජිකයන් පරිපූරක හමුදවේ සේවය සඳහා ද්විතියනය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සේවය සඳහා ද්විතියනය කරන ලද සාමාජිකයන්ගේ සේවා කොන්දේසි නියම කරනු ලැබිය යුතු ය.

59. (1) එක් එක් පරිපූරක හමුදාව එම පරිපූරක හමුදාව පිහිටු වීමේ ආඥාවෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වූ ඒකක වලින් සමන්විත විය යුතු ය. එක් එක් පරිපූරක හමුදාවේ ඒකක.

(2) පරිපූරක හමුදාවේ එක් එක් ඒකකයේ භට සංඛ්‍යාව ජනාධිපතිවරයා විසින් කලින් කල තීරණය කළ හැකි ය.

60. යම් සන්නද්ධ සේවයක හෝ පොලිස් සේවයේ හෝ විනය පාලනයට තත් කාලයේ බලපවත්නා නීතිය, සිවිල් වැරදි සම්බන්ධ නඩු විභාග කිරීමට හා දඬුවම් දීමට විධිවිධාන සළසන්නා වූ ඒ නීතියේ විධිවිධාන හැර, ඒ සන්නද්ධ සේවයේ හෝ පොලිස් සේවයේ හෝ සාමාජිකයනට අදාළ වන ආකාරයට ම පරිපූරක හමුදාවේ සාමාජිකයන් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය. පොලිස් සහ හමුදා නීති පරිපූරක හමුදාවේ සාමාජිකයන්ට අදාළ වීම.

61. සෑම පරිපූරක හමුදාවක ම සාමාජිකයින්ට තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් වැටුප් හා දීමනා ගෙවිය යුතු ය. වැටුප් ආදිය අමාත්‍යවරයා විසින් තීරණය කළ යුතු බව.

62. එක් එක් පරිපූරක හමුදාවේ තනි පුද්ගල සාමාජිකයන්ගේ දේපළ හැර, එම පරිපූරක හමුදාවලට අයත් සියලු දේපළ ද එම පරිපූරක හමුදවට හෝ එහි යම් කොටසකට අයවිය යුතු මුදල් හෝ අත්විය යුතු දේපළ නඩු පවරා අයකර ගැනීමේ හෝ අත්කර ගැනීමේ තනි අයිතිය ද, නඩු පැවරීමේ, ගිවිසුම්වලට එළඹීමේ සහ ඔප්පු ලිවීමේ පූර්ණ බලය සහ ඒ දේපළට අදාළ අනෙකුත් සියලුම නීත්‍යානුකූල දේවල් කිරීමේ පූර්ණ බලය සහිතව තත්කාලයේ එක් එක් පරිපූරක හමුදාවේ දේපළ එම පරිපූරක හමුදාවේ සේනාවිධායක වරයා වෙත සතුවීම.

එක් එක් පරිපූරක හමුදාවේ සේනාවිධායකවරයා වෙත සතුවන අතර, එම සේනාවිධායකවරයා විසින් මේ වගන්තියේ ප්‍රකාර පවරන ලද සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් එම සේනාවිධායකවරයා මිය යෑම, ඉල්ලා අස්වීම, සේවයෙන් විශ්‍රාම යෑම හෝ ධුරයෙන් ඉවත් කිරීම යන හේතු නිසා, අතහැර දැමීම හෝ නතර කිරීම නොකළ යුතු අතර, එම සේනාවිධායකවරයාගේ අනුප්‍රාප්තිකයා විසින් සහ ඔහුගේ නමින් එම නඩු කටයුතු දිගටම පවත්වා ගෙන යා හැකි ය.

ඇතැම් පනත් පරිපූරක හමුදාවේ සාමාජිකයන්ට අදාළ නොවන බව.

**63.** ගිනි අවි ආඥා පනත, පුපුරන ද්‍රව්‍ය පනත සහ 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනතේ සඳහන් කිසිවක්, යම් පරිපූරක හමුදාවක සාමාජිකයන් පෙළපාලිවල යෙදී සිටිය දී හෝ එම පරිපූරක හමුදාවේ සාමාජිකයන් වශයෙන් ඔවුන්ගේ රාජකාරි ඉටු කරන විට දී අදාළ නොවිය යුතු ය.

නියෝග.

**64.** පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) පරිපූරක හමුදාවල සාමාජිකයන් ගේ නිල ඇඳුම් ;

(ආ) පරිපූරක හමුදාවේ සාමාජිකයන් පුහුණු කිරීම ;

(ඇ) පරිපූරක හමුදාවේ සාමාජිකයන්ගේ විනය ;

(ඈ) පරිපූරක හමුදාවේ නිල තත්ත්ව ව්‍යුහය ;

(ඉ) පරිපූරක හමුදාවේ පරිපාලනය ;

(ඊ) නියම කරන ලෙස මේ පනතේ ප්‍රකාශිත හෝ නියමිත යම් කාරණයක් ;

(උ) පරිපූරක හමුදාවේ ඒකකවල සංඛ්‍යාමය පිහිටුවීම සහ එම ඒකකවල නිල තත්ත්ව ;

(ඌ) නියෝග සෑදීමට මේ පනතේ මේ කොටසේ යම් විධිවිධානයක් මගින් බලය දී ඇත්තේ හෝ නියමිතව ඇත්තේ යම් කරුණක් සම්බන්ධයෙන් ද එම කරුණ.

මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා "අමාත්‍යවරයා" යන්නෙන් පරිපූරක හමුදා විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

## VII වන කොටස

### සාමාන්‍ය

නියෝග.

**65.** (1) මේ පනතේ යම් කොටසක් මගින් නියෝග සෑදීම සඳහා බලය දෙනු ලැබ හෝ නියම කරනු ලැබ ඇත්තේ යම් කරුණු සම්බන්ධයෙන් ද ඉන් යම් කරුණක් හෝ ඒ සෑම කරුණක් සම්බන්ධයෙන්ම, අමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ නියෝගයේ නිශ්චය කොට දක්වනු ලැබිය හැකි යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට පසු හැකි ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නො ලැබූ යම් නියෝගයක්, එය අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ දින සිට පරිච්ඡින්න කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබ ඇති ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ මේ කොටසේ "අමාත්‍යවරයා" යන්නෙන් මිනිස් බලය උපයෝගි කර ගැනීම සඳහා බඳවා ගැනීමේ හා පුහුණු කිරීමේ විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.